## සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය ( SVIAS )

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

**ගිණුම්කරණ අඩුපාඩු**

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.35,017,077 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම පොත් අගය මත පදනම් වී තිබුණි. මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව මෙම වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය අවසානයට සිදුකර නොතිබුණි.

(ආ) කලින් ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් විද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

#### 2.1 මූල්‍ය සමාලෝචනය

##### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.42,314,778 ක් වූ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු රු.1,934,894 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.30,829,000 ක රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු එම වර්ෂයේ රු.1,484,826 ක ඌනතාවයක වුයෙන් රු.450,068 කින් මූල්‍ය ප්‍රතිඵලයේ තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

## 2.2 කාර්ය සාධන සමාලෝචනය

### 2.2.1 අධ්‍යයන කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පවත්වන ලද විභාග**

ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද විභාග පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමර්ථ වූ ශිෂ්‍ය සංඛ්‍යාව | ඌන සාමාර්ථ / අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| සංගත | 239 | 143 | 96 |
| නැටුම් | 126 | 108 | 18 |
| නාට්‍ය හා රංගන | 189 | ප්‍රතිඵලනිකුත් කිරීමට ඇත. | - |
| දෘශ්‍ය හා තාක්ෂණික කලාව | 153 | 127 | 26 |

**(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය**

ආයතනයේ පාඨමාලා 4 ක් සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 751 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.44,958,115 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු.59,864 ක් විය.

**(ඇ) මහපොළ සහ ශිෂ්‍යාධාර**

සමාලෝචිත වර්ෂය තුළදී ශිෂ්‍යයින් 557 ක් සඳහා ශිෂ්‍යාධාර ලෙස රු.8,859,400 ක්ද ශිෂ්‍යයින් දෙදෙනෙකු සඳහා මහපොළ ආධාර ලෙස රු.30,100 ක්ද ගෙවා තිබුණි.

## 2.3 ප්‍රසම්පාදන

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 2.3.1 අවිධිමත් මිල කැඳවීම් හා ටෙන්ඩර් මණ්ඩල තීරණ

(අ) රු.422,000 ක වටිනාකමට ආයතනයේ මුදල් ශාඛාවේ "පාටිෂන් " වැඩ සඳහා එක් සැපයුම්කරුවකු විසින් මිල කැඳවීම් තුනක් ඉදිරිපත් කර තිබුණි.

(ආ) ඉගැන්වීමේ උපකරණ සැපයීම සඳහා එක් සැපයුම්කරුවකු විසින් මිල කැඳවීම් 4 ක් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) පරිගණක උපාංග සැපයීම සඳහා එක් සැපයුම්කරුවකු මිල කැඳවීම් 3 ක් ඉදිරිපත් කර තිබුණි.

(ඈ) පරිගණක කොටස් සැපයීම සඳහා එක් සැපයුම්කරුවකු මිල කැඳවීම් 2 ක් ඉදිරිපත් කර තිබුණි.

(ඉ) ලෝහ භාණ්ඩ විෂයයන් සැපයීම් සඳහා එක් සැපයුම්කරුවකු මිල කැඳවීම් 3 ක් ඉදිරිපත් කර තිබුණි.

### 2.3.2 "කැන්වස් පැඩ්ස් " 100 ක් මිලදී ගැනීම සඳහා වැඩිපුර ගෙවීම

එකක් රු.1,125 ක් බැගින් "කැන්වස් පැඩ්ස් " 100 ක් 2011 මැයි 26 දින මඩකලපුවේ පෞද්ගලික පොත් සාප්පුවකින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද කැන්වස් පැඩ්ස් 64 ක් සහ 200 ක් පිළිවෙලින් එකක් රු.1,450 බැගින් 2011 අගෝස්තු 15 දින හා එකක් රු.1,430 බැගින් 2011 ඔක්තෝබර් 15 දින එම සැපයුම්කරුගෙන්ම මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් රු.81,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

### 2.3.3 තනි ඇඳන් මිලදී ගැනීම සඳහා වැඩිපුර ගෙවීම

රු.940,000 ක වටිනාකමට ඇඳන් 40 ක් මඩකලපුවේ පෞද්ගලික වෙළඳ සැලකින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද ටෙන්ඩර් මණ්ඩලය හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිලදී ගැනීම අනුමත කර නිර්දේශ කර නොතිබුණි. තවද තථ්‍ය වෙළඳපල වටිනාකම එක් ඇඳකට රු.13,000 ක් විය. එහෙත් එක් ඇඳකට රු.23,500 බැගින් ගෙවා තිබු බැවින් රු.420,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

### 2.3.4 අලංකාර ආලේපන ( Cosmetics) විෂයයන් මිලදී ගැනීම

කොළඹ පෞද්ගලික වෙළඳ සැලකින් රු.390,065 ක වටිනාකමට අලංකාර ආලේපන ( Cosmetics) විෂයයන් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිල ඉදිරිපත් කිරීම් ලෙස ටෙන්ඩර් මණ්ඩල ලේඛනයේ ලංසුකරුවන් 5 දෙනෙකුගේ නම් ලියා තිබුණි. එහෙත් කිසිදු ලංසුකරුවකු මිල ගණන් ඉදිරිපත් කර නොතිබූ අතර සියළුම මිල ගණන් ව්‍යාජ නම් වලින් විය. තවද මිල කැඳවීම් කිසිවක් මිල ගණන් ගොනුවේ ඇතුළත්ව නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 වගන්තිය ප්‍රකාර ටෙන්ඩර් පර්පාටිය අනුගමනය කර නොතිබුණි.

(ඇ) සම්බන්ධීකාරක විසින් විෂයයන් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර නිකුත් කිරීම් විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3.5 බිම කාපට් මිලදී ගැනීම

සමාලෝචිත වර්ෂය තුළදී බිම කාපට් මිලදී ගැනීම වෙනුවෙන් රු.898,728 ක මුදලක් කාත්තන්කුඩි හි පෞද්ගලික වෙළඳ සැලකට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇළුමිනියම් සවිකිරීම් වැඩ පොළක් වූ වෙළඳ සැල කිසිදු රජයේ දෙපාර්තමේන්තුවකට හෝ පළාත් පාලන ආයතනයකට කාපට් සපයා නොතිබුණි.

(ආ) එක් එක් කාපට් වර්ග අඩියක් සඳහා රු.480 බැගින් ඉහළ රේටයකට ගෙවීම් කර තිබුණි.

(ඇ) මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එම වර්ගයේම බිම කාපට් , වර්ග අඩියක් රු.60 බැගින් මිලදී ගෙන තිබුණි.

(ඇ) තෝරාගත් සැපයුම්කරුවන් 7 දෙනෙකුට ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි විසින් ටෙන්ඩර් ලියකියවිලි යවා තිබුණද , කාන්තන්කුඩි හි වූ එයින් එක් සැපයුම්කරුවකු ව්‍යාජ නමකින් වූ අතර, දෙවැනි සැපයුම්කරු වාහන සේවා මධ්‍යස්ථානයක් හා වෙල්ඩින් ගරාජයක් විය. මඩකලපුවෙහි අනෙක් සැපයුම්කරු වෙල්ඩින් වැඩපොළක් විය.

### 2.3.6 සංගීත භාණ්ඩ මිලදී ගැනීම

(අ) කොළඹින් සංගීත භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.1,155,830 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 නොවැම්බර් 03 දින පවත්වන ලද රැස්වීමේදී ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර තිබුණු අතර භාණ්ඩ සැපයීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට නිර්දේශ කරන ලදි. කෙසේ වුවද ටෙන්ඩර් පර්පාටිය අනුගමනය කිරීමෙන් තොරව ගෙවීම සිදුකර තිබුණි.

(ii) ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් ලෙස සහභාගී වී තිබුණු ආයතනයේ අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී විසින් වවුචර් අනුමත කර සහතික කර තිබුණු අතර කිසිදු අභ්‍යන්තර පාලනයක් නොමැතිව චෙක්පත් වලද අත්සන් තබා තිබුණි.

(iii) ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ එක් බාහිර සාමාජිකයකු 2011 ඔක්තෝබර් 18 දින ඉල්ලා අස්වී තිබුණද, 2011 නොවැම්බර් 24 දින ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු පැමිණීමේ ලේඛනයේ අත්සන් තබා තිබුණි.

(ආ) සංගීත භාණ්ඩ විෂයයන් සැපයීම සඳහා කොළඹ පෞද්ගලික සමාගමක් නමින් රු.172,000 ක් වූ චෙක්පතක් ලියා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ආයතනයට භාණ්ඩ ලැබී නොතිබුණි. එහෙත් භාණ්ඩ ලැබීම් පත්‍රිකා (GRN) වංචනිකව පිළියෙල කර ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී විසින් අත්සන් කර තිබුණි.

(ii). ටෙන්ඩරය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කර අදාළ විෂයයන් සැපයීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද සැපයුම්කරු නමින් චෙක්පත ලියා තිබුණි.

(iii) අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී විසින් උපයෝගී ලියකියවිලි නොමැතිව වංචනිකව වවුචර් අනුමත කර සහතික කර තිබුණි.

### 2.3.7 ලී පෙට්ටි මිලදී ගැනීම
-----------------------

ලී පෙට්ටි 50 ක් මිලදී ගැනීම සඳහා රු.700,000 ක මුදලක් මොරටුව පෞද්ගලික වෙළඳ සැලකට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සාමාජිකයකු විසින් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ ටෙන්ඩර් මණ්ඩල තීරණ වල අත්සන් තබා නොතිබුණි.

(ආ) තථ්‍ය අවශ්‍යතාවය රු.240,000 ක් වටිනා ලී පෙට්ටි 15 ක් පමණක් විය. කෙසේ වුවද රු.700,000 කට ලී පෙට්ටි 50 ක් මිලදී ගෙන තිබුණි.

(ඇ) සැපයුම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව එක් පෙට්ටියක් සඳහා පවතින වෙළඳපල වටිනාකම රු.5,000 ක් විය. එහෙත් එකතුව රු.700,000 කට එකක් රු.14,000 බැගින් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් රු.450,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) චෙක්පත් පෞද්ගලික ලී බඩු වෙළඳපලේ නමින් නොව වෙනත් පුද්ගලයකුගේ නමට ලියා තිබුණි.

### 2.3.8 චිත්‍රාධාර ( Easels ) ( ලී බඩු ) මිලදී ගැනීම

චිත්‍රාධාර ( ලී බඩු ) මිලද ගැනීම සඳහා මඩකලපුවේ, පළමුඑයි හි පිහිටි පෞද්ගලික වෙළඳ සැලකට රු.980,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකක් රු.14,000 බැගින් චිත්‍රාධාර 70 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද සැපයුම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව පවතින තථ්‍ය වෙළඳපල වටිනාකම රු.7,000 ක් විය. මේ සම්බන්ධයෙන් රු.490,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) පරිසර නිලධාරීගේ , ප්‍රාදේශීය ලේකම්ගේ හා අරියම්පති ප්‍රාදේශීය සභාවේ වාර්තාවට අනුව භාණ්ඩ මිලදී ගත් ස්ථානය වෙල්ඩින් ගරාජයක් වූ අතර වඩු කාර්මික වැඩපළක් නොවීය.

(ඇ) ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී විසින් තෝරාගත් සැපයුම්කරුවන් 7 දෙනෙකුට ටෙන්ඩර් ලියකියවිලි යවා තිබුණද , පළාත් පාලන ආයතනයේ ආදායම් පරීක්ෂක සමඟ කරන ලද සෘජු පරීක්ෂාව අනුව ලංසුකරුවන් 5 දෙනෙකු වෙල්ඩින් වැඩපලවල් වූ අතර එක් වෙල්ඩින් වැඩපළක කිසිදු ලී භාණ්ඩයක් නිෂ්පාදනය කර නොතිබුණ.

### 2.3.9 "බනක් බෙඩ්ස් " ( Bunk Beds ) මිලදී ගැනීම

(අ) 2008 වර්ෂයේදී වසා දමන ලද මොරටුවේ පුද්ගලික වෙළඳ සැලකින් රු.1,230,000 කට "බන්ක් බෙඩ්ස් " මිලදී ගෙන තිබුණු අතර එම ලිපිනයේම වර්ෂ දෙකකට වැඩි කාලයක් නව ව්‍යාපාර ආයතනයක් ( රෙදි සම්බන්ධ ) ක්‍රියාත්මක වේ.

(ආ) මිලදී ගැනීමට උපයෝගී කර ගැනීම සඳහා ව්‍යාජ බිල්පත් භාවිතා කර තිබුණි.

(ඇ) පුද්ගලයකු නමින් රු.615,000 ක් වූ එක් චෙක්පතක් ලියා තිබූ අතර රු.615,000 ක් වූ තවත් චෙක්පතක් ලී බඩු වෙළඳ සැල නමින් ලියා තිබුණි.

(ඈ) එකක් රු.41,000 බැගින් "බනක් බේඩ්ස් " 30 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද සැපයුම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව එකක වෙළඳපල මිල රු.30,000 ක් පමණක් විය. මේ සම්බන්ධයෙන් රු.330,000 ක් වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

## 2.3.10 "ඩ්‍රෝවින් ඩොන්කි " ( Drawing Donkey ) මිලදී ගැනීම

(අ) ව්‍යාජ ඉන්වොයිසි යොදා ගනිමින් මොරටුවේ පෞද්ගලික වෙළඳ සැලකින් රු.700,000 කට "ඩ්‍රෝවින් ඩොන්කි " මිලදී ගෙන තිබුණි. ගෙවීම් බිල්පත්‍රයේ දක්වා තිබු දුරකථන අංක දෙක මොරටුවේ පෞද්ගලික වෙළඳ සැලට නොව වෙනත් පුද්ගලයකුට අයත් වු අතර ඔහු එම විෂයයන් මිලදී ගත් වෙළඳසැලේ අයිතිකරු නොවීය.

(ආ) පුද්ගලික වෙළඳ සැල වෙනුවට පුද්ගලයකු නමින් චෙක්පත ලියා තිබුණි.

(ඇ) එකක් රු.14,000 බැගින් "ඩ්‍රෝවින් ඩොන්කි " 50 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද සැපයම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව පවතින තථ්‍ය වෙළඳපල වටිනාකම එකක් රු.5,000 ක් පමණක් විය. මේ සම්බන්ධයෙන් රු.450,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2.3.11 ලිපිගොනු කවර හා ලියුම් කවර මිලදී ගැනීම

(අ) එකක් 12 බැගින් ලිප ගොනු කවර 5000 ක් රු.60,000 කට මිලදී ගෙන තිබුණි. සැපයුම්කරුගෙන් සහ තාක්ෂණ නිලධාරීන් තිදෙනෙකුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව ලිපිගොනු කවරයක පවතින වෙළඳපල මිල රු.6 ක් විය. ඒ අනුව රු.30,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) එම වෙළඳ සැලෙන්ම එකක් රු. 6 බැගින් ලියම් කවර 5000 ක් රු.30,000 කට මිලදී ගෙන තිබුණි. සැපයුම්කරුගෙන් සහ තාක්ෂණ නිලධාරීන් තිදෙනෙකුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව ලියුම් කවරයක පවතින වෙළඳපල මිල රු.3 ක් විය. ඒ අනුව රු.15,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) මෙම විෂයයන් ප්‍රසම්පාදනය සඳහා ටෙන්ඩර් / මිල කැඳවීම් පරිපාටිය අනුගමනය කර නොතිබුණි. 2011 ජුලි 11 පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේදී ආවරණ අනුමැතිය ලබා ගෙන තිබුණි. එහෙත් සැපයුම්කරුගේ ඉන්වොයිසියේ සඳහන් දිනය වුයේ 2011 ජුනි 26 දිනයයි.

## 2.3.12 යකඩ පෙට්ටි ( Iron Boxes ) මිලදී ගැනීම

මඩකලපුවේ පෞද්ගලික වෙළඳ සැලකින් යකඩ පෙට්ටි 8 ක් මිලදී ගැනීම සඳහා රු.19,200 මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ පෞද්ගලික වෙළඳ සැල වසා දමා තිබුණි. කෙසේ වුවද ඉන්වොයිසියේ දිනය වුයේ 2011 මාර්තු 23 දිනයයි.

(ආ) වංචනික බිල්පත්‍රයක් ඉදිරිපත් කර තිබු අතර ව්‍යාජ අත්සනක් යොදා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.7,200 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

### 2.3.13 ශුභසාධන විෂයයන් මිලදී ගැනීම

ශුභසාධන විෂයයන් මිලදී ගැනීම සඳහා මඩකලපවේ පෞද්ගලික වෙළඳ සැලකට රු.631,752 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 20 දින එක් ෆැක්ස් මිල සඳහනක් පමණක් වාලච්චේනයින් ලැබී තිබුණි. කෙසේ වුවද මඩකලපුවේ පුද්ගලික ලී බඩු වෙළඳ සැලකට 2011 ජනවාරි 24 දින ගෙවීම් සිදුකර තිබුණි.

(ආ) මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ඇ) පවතින වෙළඳපල මිල ගණන් වලට වැඩි රේටයකට විෂයයන් මිලදී ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.84,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 2.3.14 ලී බඩු මිලදී ගැනීම

2011 මැයි 09 දින කාන්තන්කුඩිහි පුද්ගලික සැපයුම්කරුවකුගෙන් ලී බඩු මිලදී ගැනීම සඳහා රු.324,881 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි 07 දින හා 2011 පෙබරවාරි 23 දිනයන්හි ගනු ලැබු පිළිවෙලින් ටෙන්ඩර් මණ්ඩල තීරණය හා පාලක මණ්ඩල තීරණයට අනුව , කාන්තන්කුඩි සැපයුම්කරු ප්‍රතික්ෂේප කර ලී බඩු සැපයීම සඳහා අඩුම මිල ඉදිරිපත් කරන ලද මඩකලපුවේ සැපයුම්කරු තෝරා ගෙන තිබුණි. එහෙත් ලී බඩු මිලදී ගෙන තිබුණේ ප්‍රතික්ෂේප කරන ලද සැපයුම්කරුගෙනි.

(ආ) මඩකලපුවේ සැපයුම්කරු විසින් සඳහන් කරන ලද අඩුම මිල ගණන් වලට වඩා වැඩි රේටයක් ගෙවා තිබුණි. ඒ අනුව රු.115,690 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

### 2.3.15 මූර්ති චක්‍ර ( Sculpture Wheels ) මිලදී ගැනීම

පෞද්ගලික වෙළඳ සැලකින් රු.1,075,000 කට ( එකක් රු21,500 බැගින් ) මූර්ති චක්‍ර 50 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුර්ති චක්‍ර මිලදී ගැනීම සඳහා විවිධ පිරිවිතරයන් එවා තිබුණි.

(ආ) සැපයුම්කරු විසින් එකක් රු.21,500 ක් වු වැඩි රේටයකට සපයා තිබුණි. එහෙත් මුර්ති චක්‍ර එකක පවතින වෙළඳපල මිල රු.10,000 ක් විය. මේ සම්බන්ධයෙන් රු.575,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) පුද්ගලික සැපයුම්කරුගේ බැංකු ගිණුමෙන් වෙනුවට වෙනත් බැංකු ගිණුමක් මගින් චෙක්පත් මුදල් කර ගෙන තිබුණි. තවද "ආදයකයාගේ ගිණුමට පමණයි " යනුවෙන් චෙක්පත් රේඛනය කර නොතිබුණි.

## 2.3.16 ලෝහ භාණ්ඩ විෂයයන් මිලදී ගැනීම

ටෙන්ඩර් මණ්ඩල ලේඛනයට අනුව ලෝහ භාණ්ඩ විෂයයන් සැපයීම සඳහා මිල සැදහුම් 5 ක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෝහ භාණ්ඩ වෙළඳ සැල අයිතිකරුගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශයට අනුව මඩකලපුවේ පුද්ගලික ලෝහ භාණ්ඩ වෙළඳ සැලට අයත් මිල සැදහුම එම වෙළඳ සැල මගින් , ඉදිරිපත් කර නොතිබුණු එකක් විය. කෙසේ වුවද විෂයයන් 16 ම මෙම පුද්ගලික වෙළඳ සැල මගින් ඉහළ රේටයකට සපයා ගැනීමට තෝරා ගෙන තිබුණි.

(ආ) තවද , මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම්ගේ හා මඩකලපුව නගර සභාවේ ප්‍රකාශයන්ට අනුව ලෝහ භාණ්ඩ සැපයීම සඳහා මිල සැදහුම් ඉදිරිපත් කළ එක් සැපයුම්කරුවකු වෙල්ඩින් වැඩපොළක් විය.

## 2.4 මුල්‍ය කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවිධ සැපයුම්කරුවන්ගේ නමින් ලියන ලද වටිනාකම රු.3,622,315 ක් වු චෙක්පත් 14 ක් හා "ආදායකයාගේ ගිණුමට පමණයි " යනුවෙන් රේඛනය කරන ලද චෙක්පත් කිහිපයක්ද මඩකලපුවේ පුද්ගලික බැංකුවක පවත්වා ගෙන යන ලද එක් බැංකු ගිණුමක් මගින් මුදල් කර ගෙන තිබුණි.

(ආ) 2006 අප්‍රේල් 21 දිනැති අංක 4/2006 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව , චෙක්පත් අවිධිමත්ව මුදල් කර ගැනීමේ අවදානම අවම කර ගැනීම

සඳහා සමහර චෙක්පත් " ආදායකයාගේ ගිණුමට පමණයි" යනුවෙන් රේඛනය කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී සැපයුම්කරුවන් කිහිපදෙනෙකු නමින් ලියන ලද වටිනාකම රු.5,804,179 ක් වූ චෙක්පත් 43 ක් අදාළ සැපයුම්කරුවන්ට තැපැල් කරනු වෙනුවට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනයේ ගබඩා භාරකරු සහ ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී විසින් පෞද්ගලිකව ලබාගෙන ඔවුන් විසින් සැපයුම්කරුවන්ට නිකුත් කර තිබුණි.

## 2.5 හඳුනාගත් පාඩු

වටිනා සංගීත හා නැටුම් උපකරණ 102 ක් 2009 / 2010 වර්ෂය සඳහා පවත්වන ලද සමීක්ෂණ මණ්ඩල විසින් ඌනතා වශයෙන් වාර්තා කර තිබුණි. කෙසේ වුවද ඌනතා සම්බන්ධ වගකීම පැවරීමට හා පාඩු අයකර ගැනීමට අදාල පියවර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

## 2.6 විෂයයන් 07 ක් මිලදී ගැනීමේදී වංචනිකව රු.මිලියන 4.5 ක් වැඩිපුර ගෙවීම

භාණ්ඩ මිල පිළිබඳව දෙපාර්තමේන්තු 6 ක තාක්ෂණ නිලධාරීන්ගෙන් යුතු කණ්ඩායමක් මගින් සිදුකරන ලද විශේෂ විමර්ශනයේදී අනාවරණය වූ පරිදි ටෙන්ඩර් ලියවිලි පිළියෙල කිරීම හා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යන අදියරයන්හිදී කරනු ලැබූ වංචනික කාර්යයන් හේතුවෙන් බිම කාපට් , චිත්‍රාධාර (Easels ) , මූර්ති චක්‍ර (Sculpture Wheels ) සහ බන්ක් බෙඩ්ස් ( Bunk Beds ) වැනි විෂයයන් මිලදී ගැනීම සඳහා ගෙවන ලද මිල පවතින වෙළඳපල මිලට වඩා බොහෝ වැඩිවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 4.5 ක් වූ රජයේ අරමුදල් වංචනිකව ගෙවා තිබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ප්‍රසම්පාදන

(ඇ) මූල්‍ය කළමනාකරණය